# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල


| | | | | | |
|---|---|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | | | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 1559 / 2023 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2023 திகதி | දිනය<br>Date | 11/12/2023<br>පැය 1400 |

**මාධ්‍ය නිවේදනය**

**ප්‍රධාන කර්තෘ / ප්‍රවෘත්ති කර්තෘ,**
**අධ්‍යක්ෂ ප්‍රවෘත්ති / ප්‍රවෘත්ති කළමණාකරු,**
**සියළුම මාධ්‍ය ආයතන.**

**හොකී තරඟ ජයග්‍රහණයක් - පොලිස් ක්‍රීඩා කොට්ඨාසය.**






රාජ්‍ය සේවා ක්‍රීඩා සංගමය මඟින් සංවිධානය කරන ලද 2023 රාජ්‍ය සේවා කාන්තා සහ පිරිමි සත් සාමාජික හොකී තරඟාවලිය 2023.12.08 දින කොළඹ විශ්ව විද්‍යාලය ක්‍රීඩාංගනයේදී පැවැත්විණි.

මෙම තරඟාවලිය සඳහා ශ්‍රී ලංකාව පුරා විසිරී සිටින පිරිමි හොකී කණ්ඩායම් 05 ක් සහභාගී වූ අතර එම තරඟාවලිය සඳහා ශ්‍රී ලංකා පොලීසිය නියෝජනය කරමින් A හා B වශයෙන් පිරිමි හොකී කණ්ඩායම් 02 ක් සහභාගී විය. මෙම තරඟාවලියේ පොලිස් A කණ්ඩායම ශූරතාවය දිනා ගන්නා ලදී.

පොලිස් සැරයන් 68939 එම්.ඒ.සී. දිනේෂ් නිලධාරියා මෙම තරඟාවලියේ දක්ෂතම ක්‍රීඩකයාට හිමි සම්මානය දිනාගත් අතර දක්ෂතම දැල්පන්දු රකින්නාට හිමි සම්මානය පොලිස් පරීක්ෂක දිනුක වීරසිංහ නිලධාරියා විසින් දිනා ගන්නා ලදී.

පොලිස් හොකී කණ්ඩායමේ සභාපති ලෙස නියෝජ්‍ය පොලිස්පති ඉන්දික හපුගොඩ මහතාද, එහි ලේකම් ලෙස ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි දර්ශණ විජේසිංහ, කළමණාකරු ලෙස පොලිස් පරීක්ෂක කේ.කේ.ඩී.එල්. රත්නායක හා පුහුණුකරු ලෙස විශ්‍රාමික ගුවන් හමුදා හොකී ක්‍රීඩක පණ්ඩිතරත්න යන මහත්වරුන් කටයුතු කරනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**